# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 2171635 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1080 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 30/06/2024<br>පැය 1055 |


## මාධ්‍ය නිවේදනය

### 01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වෙරළබඩ පොලිස් ස්ථානය.

2024.06.29 වන දින රාත්‍රී කාලයේ වෙරළබඩ පොලිස් වසමේ රත්නම් පාර ප්‍රදේශයේදී වෙරළබඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන හේනමුල්ල, කොලඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

වෙරළබඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වැලිඔය පොලිස් ස්ථානය.

2024.06.29 වන දින රාත්‍රී කාලයේ වැලිඔය පොලිස් වසමේ ඇතාවැටුණුවැව ප්‍රදේශයේදී වැලිඔය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන ඇතාවැටුණුවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැලිඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. මාරක රිය අනතුරක් - පදවිය පොලිස් වසම.

2024.06.29 වන දින රාත්‍රී කාලයේ පදවිය පොලිස් වසමේ බෝගස් හන්දිය පුල්මුඩේ මාර්ගයේ අලුත් හල්මිල්ලෑව ප්‍රදේශයේදී බෝගස් හන්දිය දෙස සිට පුල්මුඩේ දෙසට ධාවන වූ ත්‍රීරෝද රථයක් එම දිසාවටම මාර්ගයේ වම් පස නවතා තිබූ ට්‍රැක්ටරයේ ටේලරයක් පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින්

ත්‍රීරෝද රථයේ රියදුරු හා පසුපස අසුනේ සිටි රියදුරුගේ මව බරපතල තුවාල ලබා පදවිය රෝහලට ඇතුලත් කිරීමේදී මව මියගොස් ඇත. ත්‍රීරෝද රථ රියදුරු රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි.

**මරණකාරිය වයස අවුරුදු 42 ක් වූ මයිලන්කුලම, බෝගහවැව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය පදවිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ට්‍රැක්ටරයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. පදවිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.

2024.06.29 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 25 මිලිග්‍රෑම් 520 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.

2024.06.29 වන දින සවස් කාලයේ කැස්බෑව පොලිස් වසමේ විජිතපුර ප්‍රදේශයේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 62 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කැස්බෑව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන තෙලවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**